ශීර්ෂ 321 - නැගෙනහිර පළාත් සභාව - 2021

-------------------------------------------------

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

-------------------------------------

1.1 දැක්ම

-------

පළාතේ ජනතාවගේ අවශ්‍යතා හා අපේක්ෂා තෘප්තිමත් කරන උසස් පාලන ක්‍රමයක් ඇති කිරීම.

1.2 මෙහෙවර

-----------

ජනතාවගේ වැඩිදියුණු වූ ජීවන තත්ත්වයක් උදෙසා කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබාදීම සඳහා සම්පත් එක්රැස් කිරීම හා ඒවා ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.

1.3 ප්‍රධාන කාර්යයන්

-------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

මුළු ප්‍රතිපාදනය හා වියදම

-----------------------------

නැගෙනහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 36,626.14 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 33,931.65 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,694.49 ක් හෙවත් සියයට 7.36 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2021 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 30,643.00 | 30,424.03 | 218.97 | 0.71 |
| මූලධන | 5,983.14 | 3,507.62 | 2,475.52 | 41.37 |
| එකතුව | 36,626.14 | 33,931.65 | 2,694.49 | 7.36 |

3. විගණන නිරීක්ෂණය

----------------------

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.